# මිලියොයිඩෝසිස් වැළැක්වීම

මිලියොයිඩෝසිස් යනු පසෙහි සහ මඩ සහිත ජලයෙහි බහුලව සිටින බැක්ටීරියාවකින් ඇතිවන රෝගයකි.

ආසාධිත ශරීර අවයවය අනුව, රෝග ලක්ෂණ වෙනස්වේ. උණ, හිසරදය, ශරීරයේ වේදනාව හෝ ඉදිමීම, වණ, පපුවේ වේදනාව, කැස්ස, රක්තපාතය සහ වසා ගැටිති ඉදිමීම මෙයට ඇතුළත් වේ.

ආසාධිත පස හා මතුපිට ජලය (විශේෂයෙන් සමේ සීරීම්/තුවාල) සමඟ සම්බන්ධ වීමෙන් මිනිසුන් ආසාදනය විය හැක; බැක්ටීරියා ඇති දූවිලි / ජල බිඳිති ආශ්වාස කිරීම; සහ ජලය පානය කිරීම නිසාත් ආසාදනය විය හැක; පුද්ගලයාගෙන් පුද්ගලයාට සම්ප්‍රේෂණය වීම දුර්ලභ නමුත් ආසාදිත පුද්ගලයෙකුගේ රුධිරය හෝ ශරීර තරල සමඟ සම්බන්ධ වීමෙන් ආසාදනය සිදු විය හැක.

දියවැඩියාව, පෙනහළු රෝග, අක්මා රෝග, වකුගඩු රෝග, පිළිකා හෝ ප්‍රතිශක්තිකරණය අඩු වීම වැනි රෝග ඇති පුද්ගලයින්ට රෝගය වැළඳීමේ වැඩි අවදානමක් ඇත.

කෘෂිකාර්මික, රසායනාගාර සහ සෞඛ්‍ය සේවා සේවකයින් ද වැඩි අවදානමක් ඇත.

වැළැක්වීමේ පියවර:

- ✓ ආසාධිත පස සමඟ සම්බන්ධ වීමෙන් වළකින්න.
- ✓ පස හෝ ජලය සමඟ සම්බන්ධ විය හැකි ක්‍රියාකාරකම්වලට සහභාගී වන විට සුදුසු ආරක්ෂිත ඇඳුම් හෝ පාවහන් පළඳින්න, උදා: අත්වැසුම් සහ බූට් පළඳින්න.
- ✓ ආසාධිත ජලයට හෝ පසට නිරාවරණය වූ පසු සෝදන්න හෝ ස්නානය කරන්න.
- ✓ සෑම විටම ඕනෑම තුවාලයක් හැකි ඉක්මනින් පිරිසිදු කරන්න සහ ඕනෑම කැපුමක් දිය කාන්දු නොවන සේ තුවාලය ආවරණය කරන්න.
- ✓ පස සමඟ කටයුතු කිරීමෙන් පසු හෝ ගෙවතු වගාව කිරීමෙන් පසු සබන් හා ජලය සමඟ අත් සෝදන්න.
- ✓ ආහාර පිරිසිදුව පිළියෙළ කරන්න සහ අපිරිසිදු රත් නොකල ජලය පානය කිරීමෙන් වළකින්න.
- ✓ එළිමහන් ජල ක්‍රීඩා හරහා රෝගය වැළඳිය හැකිය. ආසාධිත විය හැකි ජල මූලාශ්‍ර (ගංගා, පොකුණු හෝ වැව් වැනි) ආවරණය කර සිටීමෙන් ආසාදන අවදානම අවම කර ගත හැක.

අනුවාද දිනය: 1 නොවැම්බර් 2022